www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හේගල්, මාක්ස්, එංගල්ස් සහ මාක්ස්වාදයේ සම්භවයන්

## ටොම් රොක්මෝර්ගේ *මාක්ස්වාදයෙන් පසු මාක්ස්: කාර්ල් මාක්ස්ගේ දර්ශනය* නමැති කෘතිය පිලිබඳ විමර්ශනයක්

## Hegel, Marx, Engels, and the Origins of Marxism
## A review of *Marx After Marxism: The Philosophy of Karl Marx* by Tom Rockmore

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2006 මැයි 3**

*පහත පලවන්නේ කොටස් දෙකකින් සමන්විත ලිපියක දෙවන කොටස ය. පලමු කොටස ඊයේ පලකෙරිනි.*

රොක්මෝර් තම අවධානය මාක්ස් වෙත යොමු කරනවාත් සමග ඔහු එංගල්ස්ට එල්ල කරන ප්‍රහාරයේ අරමුන විනිවිද පෙනී යයි. තම යාවජීව මිත්‍රයා හා සහෝදරයා වූ තැනැත්තාගේ සංකල්පයන් මුසාකරනය හා විකෘතකරනය කොට, "මාක්ස්වාදය" නමින් හැඳින්වෙන්නා වූ දෙයක් නිර්මානය කලේ දාර්ශනික අඥානයෙකු වූ එංගල්ස් යයි ප්‍රකාශ කිරීම මගින් රොක්මෝර්, "අලුත්" - එනම්, මාක්ස්ගේ මරනින් පසු එංගල්ස් විසින් මවාපාන ලද්දදේ යයි උපකල්පනය කර ගත් භෞතිකවාදී "වෘත්තාන්තයෙන්" (පශ්චාත් නූතනවාදී හඩුබස යොදා ගන්නේ නම්) තොර මාක්ස් කෙනෙකු කඩතිරහැර ඉදිරිපත් කිරීමට තමාට නිදහස ඇතැයි, හඟියි. රොක්මෝර් මේ අනුව, එංගල්ස්ගේ ද "මාක්ස්වාදීන්" පරම්පරා ගනනාවක ද අභ්‍යර්ථනයන්ට ප්‍රතිවිරුද්ධව සැබෑ මාක්ස්ට හෙගල්ගේ දාර්ශනික දෘෂ්ටිය සමග සැලකිය යුතු නොඑකඟතාවන් නො පැවති බවක් තහවුරු කරන්නට තතනයි. රොක්මෝර් මෙසේ කියයි; "මාක්ස් හා හේගල් අතර, නැතහොත් මාක්ස් හා දර්ශනවාදය අතර, එසේත් නැතහොත් දර්ශනවාදය හා විද්‍යාව අතර විභේදනයන් පවතීයයි පලවන දේශපාලනිකව ප්‍රේරිත වූ අභ්‍යර්ථනයන්ගෙන් ඔබ්බට යාම අත්‍යවශ්‍යය; මන්දයත් අවසාන විග්‍රහයේ දී මාක්ස් හුදු දර්ශනවාදියෙක්, එනම් ජර්මානු දර්ශනවාදියෙක්, පමනක් නොව ජර්මානු හෙගල්වාදියෙක් ද වන්නේ ය යන අරුතින් මාක්ස් ජර්මානු විඥ්ඥානවාදී දර්ශනවාදියෙක් වී යයි යමෙකුට දැකගත හැකි වන්නේ එම මාර්ගයෙන් පමනක් වන නිසා ය."(161)

රොක්මෝර් කරලියට බැස සියල්ල නිවැරදි කිරීමට පෙර "මාක්ස්වාදීන්" විසින් විඥ්ඥානවාදයට සැබෑ මාක්ස් දැක් වූ පක්ෂපාතිත්වය ප්‍රතික්ෂේප කොට වසං කර දමනු ලැබ තිබුනු බව අප දිරවාගත යුතුව ඇත. රොක්මෝර් තව දුරටත් කියා සිටින්නේ, "ඔවුන් (එනම් මාක්ස්වාදීන් - පරිවර්තක) මාක්ස්ට භෞතිකවාදී හා ප්‍රතිහේගලියානුවාදී ආස්ථානයන් ආරෝපනය කිරීම වනාහී බොහෝදුරට දාර්ශනික කටයුතු පිලිබඳව ඔවුන්ගේ ම න්‍යායික නො හැකියාවේ ප්‍රතිඵලයකි." "එංගල්ස් දර්ශනවාදය ගැන වත් හේගල් පිලිබඳව වත් එතරම් හොඳින් දැන නො සිටියේ ය"යි රොක්මෝර් ලියයි. "එංගල්ස්ගෙන් පසුව හේගල් පිලිබඳව කුසලතා පූර්න දැනුමක් තිබුනේ ලෙනින් ද ඇතුලු මාක්ස්වාදීන් කිහිප දෙනකුට පමනි. හේගල් පිලිබඳ මාක්ස්වාදී අවතක්සේරුව මගින් මාක්ස්ගේ ආස්ථානය සඳහා හේගල් දරන අර්ථභාරය පිලිබඳ දැනුවත් බව අකාමකා දැමීය."(162)

මාක්ස් විඥ්ඥානවාදියෙකු ලෙස අලුතෙන් අර්ථකථනය කිරීමට දරන ප්‍රයත්නය මෙන්ම "හේගල් පිලිබඳව බැරෑරුම් අධ්‍යයනයක නිරත වී ඇත්තේ ලෙනින් ද ඇතුලු මාක්ස්වාදීන් අතලොස්සකි"යි යන ඔහුගේ ප්‍රකාශය ද මුග්ධ එකකැයි බැහැර කල හැකිය. මෙහිලා ද රොක්මෝර් පදනම්වී ගන්නේ නරුමත්වයේ හා උදාසීනත්වයේ ගිලී සිටින ශාස්ත්‍රාලගත තට්ටුව තුල ප්‍රජාවකගේ බුද්ධිමය අනුගතවීම මතය. අඩු වශයෙන්, තමා ක්‍රියාකාරීව සිටින ශාස්ත්‍රාලික කවරෙකු හෝ කිසිදු ම පදනමක් හෝ නොමැති දෑ ඇදබෑම ගැන තමන්ගෙන් ප්‍රශ්න නොකරන බව හේ දනී. "රුසියානු මාක්ස්වාදයේ පියා"වූ ජී.බී. ප්ලෙකානොව්ගේ ලේඛන සමාලෝචනය කිරීමට රොක්මෝර් කවදා හෝ කරදර වී ඇති ද? ප්ලෙකානොව්ගේ දාර්ශනික සංකල්ප සමග එකඟ නො වන අයෙකු වුවත්, හේගල් පිලිබඳව ඔහුට තිබූනු පරිචය ප්‍රගාඪ පරප්‍රාප්තියකට වඩා අඩු එකකැයි සද්භාවයෙන් නම් කිව නො හැකිය. *Conspectus on Hegel's Science of Logic* (හේගල්ගේ තර්ක විද්‍යාව පිලිබඳ පොදු සමාලෝචනයක්) යන ලෙනින්ගේ කෘතිය පිලිබඳව රොක්මෝර් දන්නේම නැතිද? 1914-15 සමයේ දී ලියන ලද ලෙනින්ගේ "දාර්ශනික සටහන් පොත්" හේගල්ගේ *Logic* (තර්ක ශාස්ත්‍රය) පිලිබඳව විස්තෘත විවරනයක් ද ඇතුලත් කර පසු කලක පල කිරීමෙන් ලෙනින්ගේ දේශපාලන වැඩ

කටයුතුවල පෘථුල න්‍යායික පදනම් අවබෝධ කර ගැනීමට ප්‍රබල ගාමකයක් සම්පාදනය කලේය. මාක්ස්වාදී විද්වතුන් - මොවුන් අතරට - රොක්මෝර් පවා ප්‍රසංශා කරන බවක් කියා පාන - ලූකාෂ් ද අයත් ය - අතර හේගල් පිලිබඳ න්‍යායික උනන්දුව යලි දැල්වීමට අර්ථාභාරීව ප්‍රතිපදානය කලේ නිශ්චිතව ම ලෙනින්ගේ විමර්ශනය බව රොක්මෝර් නො දන්නා සේ ය. අපෝහකාත්මක විධික්‍රමයේ පරප්‍රාප්තියක් දක්වන ට්‍රොට්ස්කිගේ රචනාවන් ගැන හෝ ඩෙබොරින් හා අක්සෙල්රොද් වැනි සෝවියට් න්‍යායාචාර්යවරුන්ගේ කෘති ගැන කීමට ඇත්තේ කුමක්ද? සෝවියට් සංගමය තුල (ස්ටැලින්ගේ පාලන කාලය තුල මෙන් ම ඉන් පසුව ද) බල පැවැත් වූ, බැරෑරුම් න්‍යාය සතුරු වරප්‍රසාදිත නිලධාරීතන්ත්‍රයක් විසින් පටවන ලද මර්දනකාරී කොන්දේසි මධ්‍යයේ වුව ද, හේගල් හා මාක්ස් අතර සම්බන්ධතාවය වටහාගැනීමට වැදගත් ප්‍රතිපදානයන් කල පසුකාලීන සෝවියට් දර්ශනවාදීන් වූ මිකායිල් ලිෆ්ෂිට්ස් හා ඊ.වී. ඉලියෙන්කොව් වැන්නවුන්ගේ නම් ද අපට මෙයට එකතු කල හැකි ය.

එංගල්ස් වනාහි, සරලව ම දර්ශනවාදයේ අදාලත්වය නො තකා හල යථානුභූතවාදියකු වූයේ ය යනුවෙන් ඉදිරිපත් කිරීමට රොක්මෝර් දරන ප්‍රයත්නයන්වලට ලොකු ම බාධකයන් වන්නේ එංගල්ස්ගේ ම වචන යයි අපි විසින් කල්තබාම පෙන්නුම් කරනු ලැබ ඇත. එසේ ම මාක්ස්, ජර්මානු විඥ්ඥානවාදියෙකු වී ය යන රොක්මෝර්ගේ ආලාපයේ බන්ධනය මාක්ස්ගේ ම රචනාවන් තුලම පවතී. ඉතා සීමිතව හා පරෙස්සමින් තෝරා බේරා උපුටා දක්වමින් රොක්මෝර් මාක්ස්ගේ කෘතීන් වටා හොර ගල් අහුලමින් යන ගමන, පෙන්නුම් කරන්නේ තම ප්‍රවාදයේ පදනම් බෙහෙවින්ම වැනෙන සුලු බව ඔහු ම දන්නා හෙයිනි.

මාක්ස් හේගල්ගෙන් බිඳී වෙන්වූ බවට පැතිර පවත්නා විශ්වාසයට මාක්ස් ම "පාර්ශවීයව වගකිව යුතු" බව සඳහන් කිරීම මගින් රොක්මෝර් මුලපුරන්නේ ම වරද්දාගෙන ය. මෙය මෙසේ වන්නේ *Capital* (ප්‍රාග්ධනය) කෘතියේ දෙවන සංස්කරනයේ නිතර උපුටා දැක්වෙන පසුවදනේ ඡේදයක තමන්ගේ ම ආස්ථානය, හේගල්ගේ ආස්ථානය උඩුකුරු කිරීමේ ප්‍රතිඵලය හේතුවෙන් යයි ප්‍රකාශ කරන රොක්මෝර් - මාක්ස් එය දක්වන ලද්දේ "දුරවබෝධී" ලෙස යයි කියා සිටී. එංගල්ස්ගේ පටන් මාක්ස්වාදී පරම්පරා ගනනාවක් ම මාක්ස්ගේ ආස්ථානයට ප්‍රවිෂ්ටව ඇත්තේ හේගල් ගේ ආස්ථානයේ ප්‍රතිලෝමය ලෙස ය.

ඇත්ත වශයෙන් නම් රොක්මෝර් සඳහන් කර ඇති ඡේදයෙහි කිසිදු දුරවබෝධ භාවයක් ඇත්තේ නැත. 1873 ජනවාරියේ දී මාක්ස් ලියා තුබුවේ මෙය යිඃ

"මගේ අපෝහක විධික්‍රමය, හේගලියානු අපෝහකයට වෙනස් වනවා පමනක් නොව එහි සෘජු ප්‍රතිවිරුද්ධය ද වේඃ හේගල්ට නම්, "'පරම අධ්‍යාසය' යන නාමය යටතේ ස්වාධීන විෂයක් බවට පවා ඔහු විසින් පරිවර්තනය කරගනු ලබන මිනිස් මොලයේ ජීවක්‍රියාවලිය එනම් චින්තන ක්‍රියාවලිය, සැබෑ ලෝකයේ නිර්මාපකයා (demiurgos) වූ අතර සැබෑ ලෝකය වනාහී හුදෙක් එම පරම අධ්‍යාසයේ බාහිර, ප්‍රපංචමය ස්වරූපය පමනි. එයට ප්‍රතිවිරුද්ධව මට නම් අධ්‍යාසය යනු මිනිස් මනස මගින් ප්‍රතිබිම්බනය කොට ද, චින්තනයේ රූපාකාරයන්ට පරිවර්තනය කොට ද ඇත්තා වූද ද්‍රව්‍යමය ලෝකය මිස වෙන කිසිවක් නො වේ." [*Capital*, (ප්‍රාග්ධනය, පලමු වෙළුම, මොස්කව්, 1970, 29 පිටුව)]

අප උපුටා දැක්වූ ඉංග්‍රීසි පරිවර්තනය වනාහී මාක්ස් මුලින් ජර්මන් බසින් ලියූ දෙය ම එයට මුලුමනින්ම අනුකූලව ඉදිරිපත් කිරීමකි. මාක්ස්ගේ වචන තුල දුරවබෝධ, වක්‍ර හෝ අවුල් සහගත කිසිවක් ඇත්තේ නැත. තමන්ට හැකි උපරිම පැහැදිලි කමින් යුතුව මාක්ස් කියන්නේ තමන්ගේ විධි ක්‍රමය, හේගල් ගේ විධි ක්‍රමයෙන් අතිමූලික වශයෙන් වෙනස් - "එහි සෘජු ප්‍රතිවිරුද්ධය" - බවයි; ඒ මන්ද? හේගල් ගේ අපෝහකය වනාහී යථා ලෝකය යනු හුදෙක් චින්තනයේ ප්‍රකාශනයක් ලෙස ගන්නා වූ විඥ්ඥානවාදී අපෝහකයක් වන හෙයිනි; එසේම මාක්ස්ට චින්තන රූපාකාර යනු සැබවින් ම පවතින ද්‍රව්‍යමය ලෝකය මිනිස් මනස තුල පිලිබිඹු වීමක් වන හෙයිනි. මෙහි දී විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු දෙයක් නම් " *මිනිස් මනස විසින් පිලිබිඹු කරනු ලබන*" යන වාක්‍යාංශය භාවිතා කරනු ලබන්නේ මාක්ස් විසින් ම බවය. එහෙත් රොක්මෝර් අපට කියන්නේ (6 වන පිටුව) "අපගේ අභිප්‍රායන් සඳහා මාක්ස්වාදීන් ගේ දීර්ඝ පරම්පරාවක් විසින් පසු කාලීනව පිලිගන්නා ලද ඥානයේ ප්‍රතිබිම්බන න්‍යායට මාක්ස්ගේ රචනයන් තුල පදනමක් නැතැයි පෙන්වා දීම සෑහෙන්නේ ය"යි අපට කියයි. අප දැනටමත් කියා ඇති පරිදි, (මේ මත ගටනාව නම් - පරිවර්තක) ඕනෑ ම දෙයක් ඔට්ටුය!

මාක්ස්ගේ ලේඛන රොක්මෝර්ට නිමක් නැති දුෂ්කරතා මතු කරයි. මාක්ස්ගේ, *Critique of Hegel's Philosophy of Right* "*හේගල්ගේ යුක්තිය පිලිබඳ දර්ශනවාදයේ විචාරය*" යන කෘතිය සඳහන් කරන රොක්මෝර් "මාක්ස් ප්‍රකාශයට පත් කිරීමට අදහස් නො කල මෙම කෘතිය, පුන පුනා එකම දෙයක් කියන කියවීමට අමාරු එකකැ"යි අපට කියයි (47). රොක්මෝර්ට නම් සහතිකෙන් ම එය එසේ ය. ඔහුගේ අමාරුවට හේතුව, මාක්ස් හේගලියානු විඥ්ඥානවාදියකු ලෙස ඉදිරිපත් කිරීමට රොක්මෝර් දරන ප්‍රයත්නය සමග මාක්ස්ගේ විචාරයේ අන්තර්ගතය කිසිදු අයුරකින් හෝ සමහන් කල නො හැකි වීමයි.

මාක්ස්, මෙම *විචාරය* ලියමින් හේගල්ගේ දාර්ශනික පද්ධතිය පුපුරවාහැරියා වූ ද, ඔහුගේ අපෝහක විධි ක්‍රමයේ ගූඪත්වය ඉවත් කලා වූ ද සමාජයීය සත්වයෙකු ලෙස මිනිසා පිලිබඳ ඓතිහාසික අධ්‍යයනය තුල මුල් බැස ගත් අව්‍යාජ භෞතිකවාදි ස්වභාව විද්‍යාවක් වර්ධනය කිරීමේ පදනම් ස්ථාපනය කල න්‍යායික වැඩ කටයුතු (මෙයට එංගල්ස් ද ඉමහත් ප්‍රතිපදානයක් කලේය.) අරම්භ කලේය. මාක්ස් ගේ මෙම කෘතියට පෙර, ලුඩ්විග් ෆොයබාක් විසින් රචිත කෘතිය [කිතු දහමේ සාරය - පරිවර්තක] (රොක්මෝර් මේ පිලිබඳ කිසිවක් සඳහන් නො කරන තරම්ය.) මගින් සම්පාදනය කරන ලද විචාරාත්මක ප්‍රේරනය ද සහිතව ලියන ලද මාක්ස් ගේ *විචාරයේ* තීරනාත්මක ජයග්‍රහනය වූයේ, ඓතිහාසික හා සමාජීය විශ්ලේෂනය සඳහා උපකරනයක් ලෙස හේගල් ගේ කාල්පනික විඥ්ඥානවාදයේ නොපොහොනා බව පැහැදිලි කිරීමයි. හේගල් දැරූ මතය නම් පරම අධ්‍යාසයේ අපෝහක ප්‍රතිසංරචනයේ වෛෂයික ක්ෂනයන් ලෙස තමා විභාග කල තාර්කික ප්‍රවර්ග, භෞතික යථාර්ථයේ එම අධස්ථ හා අභ්‍යන්තර පදනම් වූ බවය. ඔහු පැවැත්මේ (භවයේ) රූපයන් නිපයාගත්තේ වියුක්ත තාර්කික චින්තනයේ අපෝහක සන්තතියෙනි. විඥ්ඥානය හා යථාර්ථය අතර සැබෑ සම්බන්ධය කනපිට හැර වූ හේගල් ගේ පටිපාටිය එමගින් මිනිසා ජීවත්වන "සිවිල් සමාජය" (හේගල් පවත්නා සමාජ පර්යාය නම් කල පරිදි) සැබැවින් ම ඥානනය කර ගැනීමේ මග අසුරා ලූ බව මාක්ස් පෙන්වා දුනි. සැබෑ සමාජීය ක්‍රියාදාමයන්ගේ ද්‍රව්‍යමය මූලාශ්‍ර සොයා ගන්නවා වෙනුවට හේගල් කලේ ඒවා වියුක්ත තාර්කික සම්බන්ධතා ලෙස සලකා බැලීමය. මාක්ස් හේගල්ගේ විධික්‍රමය (පරිවර්තක) මෙසේ විස්තර කලේ ය.

"එහෙයින් පවුල හා සිවිල් සමාජය දේශපාලන රාජ්‍යය බවට සංක්‍රමනය වීම වනාහී, මෙයයිඃ *ගම්‍යව* රාජ්‍යයේ ද මනස වන්නා වූ මෙම ක්ෂේත්‍රයන්ගේ මනස, දැනුදු තමන් කෙරේ ම එසේ හැසිරෙමින් ඒවායේ (එම ක්ෂේත්‍රවල, - පරිවර්තක) අභ්‍යන්තර හරය ලෙස තමාට ම තථ්‍ය වන්නේ ය. මෙසේ සංක්‍රමනය නිෂ්පන්න වන්නේ, පවුල යනාදියේ හා රාජ්‍යයේ සුවිශේෂ ස්වභාවයෙන් නොව *ආවශ්‍යකතාවය නිදහස* කෙරේ දරන්නා වූ පොදු සම්බන්ධතාවෙනි. මෙය වනාහී තර්කයේ දී ක්‍රියාත්මක වන පරිදි ම, සාරයේ ක්ෂේත්‍රයේ සිට සංකල්පයේ ක්ෂේත්‍රය කරා සිදු කරන්නා වූ එම සංක්‍රමනය ම වේ. ස්වභාව ධර්මය පිලිබඳ දර්ශනවාදයේ දී අකාබනික ස්වභාවයේ සිට ජීවය කරා ද මෙම සංක්‍රමනය සිදු කෙරේ. මෙම ප්‍රවර්ගයෝ ම, විටෙක මේ හෝ විටෙක ඒ ක්ෂේත්‍රය සඳහා ද ආත්මය සම්පාදනය කරති. මෙය වනාහී හුදෙක් වෙන් වෙන් සංයුක්ත ගති ලක්ෂනයන් සඳහා සම්පාත වන වියුක්ත ගති ලක්ෂන හඳුනා ගැනීම පිලිබඳ ප්‍රශ්නයක් පමනි." (*Marx-Engels Collected Works,* මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති, 3වන වෙලුම, නිව්යොක් 1976 පි.10)

මාක්ස්, උදාහරනයක් හැටියට හේගල් ගේ *Philosophy of Law* (නීතිය පිලිබඳ දර්ශනවාදයේ) එන (හෙගල්ට) ආවේනික වූ පැටලුම් සහගත දුරවබෝධ ලක්ෂන සහිත ඡේදයක් විභාග කරයි. හේගල්ගේ එම ඡේදය මෙසේය. "**අධ්‍යාසතාව තුල (පවත්නා) ආවශ්‍යකතාව වනාහී අධ්‍යාසය එය තුලින් ම සංවර්ධනය වීමයි. ආත්මීය සාරගර්භතාව වශයෙන් ගත් කල්හි එය වනාහී දේශපාලනික විශ්වාසයයි. ඉන් වෙනස්ව වෛෂයික සාරගර්භතාව වශයෙන් එය, තනිකරම *දේශපාලන රාජ්‍යය හා එහි ව්‍යවස්ථනය* වශයෙන් රාජ්‍යය නම් ඓන්ද්‍රියයයි."** (3 වන වෙලුමේ උපුටා දැක්වේ. 10 පි.)

(ඉහත දැක්වුනු) ගූඪ හෙගලියානු වාංමාලාවේ සැඟව පවත්නා න්‍යායික දිලිඳුභාවය හා විතන්ඩවාදය පවා ඉන් පසුව මාක්ස් මෙසේ හෙලිදරව් කරයිඃ

"මෙහි *උක්තය* වන්නේ 'අධ්‍යසතාවය තුල පවත්නා ආවශ්‍යකතාවය'යි 'අධ්‍යාසය තුල ම පවත්නා එයම' යි. *ආඛ්‍යාතය නම්ඃ* *<u>දේශපාලනික විශ්වාසය</u> හා <u>දේශපාලන ව්‍යවස්ථනයයි.</u>* සරල බසින් කිවහොත් *<u>දේශපාලනික විශ්වාසය</u>* ආත්මීය වන අතර *<u>දේශපාලනික ව්‍යවස්ථනය</u>* රාජ්‍යයේ *<u>වෛෂයික සාරගර්භතාවයි.</u>* පවුල හා සිවිල් සමාජය රාජ්‍යය කරා තාර්කිකව සංවර්ධනයවීම හුදු *<u>රැවටිල්ලකි.</u>* එසේ කියන්නේ පවුලේ මනෝගතිය, සිවිල් මනෝගතිය, පවුල් සංස්ථාව හා ඒ හැටියට ගත්විට සමාජ සංස්ථා දේශපාලනික විශ්වාසයට හා දේශපාලනික ව්‍යවස්ථාවට අනුබද්ධ වන්නේ කෙසේ ද යන්නත් ඒවා ම එකිනෙකට බැඳී පවත්නේ කෙසේ ද යන්නත් පැහැදිලි නො කරන නිසා ය." (3 වන වෙලුම, 10-11පිටු)

මාක්ස් මෙසේ ලියයි, "ඒකායන අරමුන වන්නේ රාජ්‍යයේ හෝ වේවා ස්වභාවධර්මයේ හෝ වේවා හේගල්ගේ ශුද්ධ හා සරල 'අධ්‍යාසය', "තාර්කික අධ්‍යාසය" යලි සොයා ගැනීම ය; එසේ වූ කල අපට ඉතුරුවන්නේ තථ්‍ය අවබෝධයේ දෘෂ්‍යමානය පමනි. ඒවා ඒවායේ සුවිශේෂිත ආකාරයෙන් ග්‍රහනය කරගනු නොලබන හෙයින් ඒවා අනවබෝධිත ය; අනවබෝධිතව ම පවතිත්." [*Marx-Engels Collected Works,* 3වෙලුම, 12 පිටුව) මගේ අවධාරනය%

හේගල්ගේ විධික්‍රමයේ සාරභූත දුර්වලතාව වන්නේ "ඔහු සිය චින්තනය විෂයයෙන් වර්ධනය නො කර ගන්නා අතර විෂයය කල්තියා ඔහු සකස් කරන ලද ඒ වන විටත් වියුක්ත කර්කනයේ ක්ෂේත්‍රය තුල නොවෙනස් වන පරිදි පිහිටුවාගෙන තිබුනු වියලි චින්තනයකට අනුව ඉදිරිපත් කරන හෙයිනි. එය

දේශපාලන ව්‍යවස්ථනයේ සුවිශේෂී අදහසක් විකාශනය වීම පිලිබඳ ගැටලුවක් ලෙස ගනු නොලැබේ. ඒ වෙනුවට එය ගනු ලබන්නේ අධ්‍යාසයේ සජීවී ඉතිහාසයේ අවධියක් පරිද්දෙන් දේශපාලන ව්‍යවස්ථනය තහවුරු කර ලීමේ ගැටලුවක් ලෙස ය.

එය වනාහී පැහැදිලිව ම ගුඪ කරනයේ උදාහරනයකි. මාක්ස් හේගලියානු ප්‍රවිෂ්ටයේ අතිමූලික වැරැද්ද මෙසේ සම්පින්ඩනය කරයිඃ "දර්ශනවාදී වැඩ කටයුතු සමන්විත වන්නේ දේශපාලන නිර්වචනයන් තුල චින්තනය දේහමය කිරීම නොව පවත්නා නිර්වචනයන් වියුක්ත චින්තනය තුලට වාෂ්ප කරලීමය. දාර්ශනික අංගය වන්නේ කාරනයේ තර්කනය නොව තර්කනයේ කාරනයයි. තර්කය රාජ්‍යය සනාථ කිරීමට සේවය කරනවා වෙනුවට තර්කය සාධනය කිරීම සඳහා රාජ්‍යය යොදා ගැනේ." (3වන වෙළුම 18 පිටුව)ග

රොක්මෝර් හෙගලියානු විධික්‍රමය පිලිබඳ මාක්ස්ගේ ප්‍රගාඪ විවේචනය මගහැර යයි. සරලව ම එය "වේදනාසහගතය." මාක්ස් ගේ ම න්‍යායික සංවර්ධනය කෙරේ එය දැරූ දූරගාමී අර්ථභාරය පිලිගන්නේ නැතිවම ඔහු කරන්නේ හේගල් තර්කය මගින් රාජ්‍යය නිෂ්පන්න කර ගැනීම පිලිබඳ මාක්ස් ගේ විවේචනය ගැන යන්තමින් සඳහන් කිරීම පමනි; එහෙත් මාක්ස් ගේ "හේගල් පිලිබඳ විවේචනය හෙගල්ට සාධාරනය ඉටු කරයි ද? නැතහොත් එය හේගල්ව වරදවා වටහා ගැනීමක් මත රඳා තිබේ ද යන්න අප අපගෙන් ම අසාගත යුතු ය"යි කියමින් රොක්මෝර් ඇත්ත වශයෙන් ම උත්සාහ කරන්නේ එය මාක්ස් හේගල් පිලිබඳව කල තියුනු විවේචනය වරදවා වටහා ගැනීමක් ලෙස නොතකා හැරීමට ය. (48). මෙම ප්‍රශ්නය රොක්මෝර් ගේ ව්‍යාපෘතියෙහි පදනමේ පවත්නා බුද්ධිමය වංචනිකත්වය හෙලිදරව් කරයි. එක් පසෙකින් මාක්ස් හෙගලියානු විඥානවාදියෙක් වී යයි ද පසු කලෙක විඥානවාද විරෝධී "මාක්ස්වාදය" නිර්මානය කිරීම වනාහී භෞතිකවාදී පදවි සොරෙකු වූ ෆ්‍රෙඩ්රික් එංගල්ස් හොරෙන් ඇතුලු කල මැවීමක් බව ද ඔහු කියයි. අනෙක් අතට හේගල්ව භෞතිකවාදී ආස්ථානයකින් විවේචනය කරමින් මාක්ස් ලියූ රචනයන් සඳහන් කිරීමට තමන්ට බල කෙරෙන විට මහාචාර්යවරයා කියා සිටින්නේ මාක්ස් තමා කියන්නේ කුමක් ද යන්න පිලිබඳ ව තමා ම නො දැන සිටි බවයි.

විවේචනය ලිවීමෙන් පසුව මාක්ස් හෙගලියානු අපෝහකය භෞතිකවාදීව ගුඪහරනය හා ප්‍රතිකරනය කරමින් (එංගල්ස් ගේ ද අර්ථභාරී සහයෝගයෙන්) ලියූ කෘති මාලාව පිලිබඳව ද රොක්මෝර් එම වංකත්වය ම පවත්වා ගෙන යයි. *1844 ආර්ථික හා දාර්ශනික අත්පිපි* තුල දී මාක්ස් ඉදිරිපත් කල හෙගලියානු විධික්‍රමය පිලිබඳ දීර්ඝ හා සවිස්තරාත්මක විශ්ලේෂනය ගැන ද කීමට කිසි දෙයක් රොක්මෝර්ට ඇත්තේ නැත. මාක්ස් මෙම කොටස නම් කලේ *සමස්තයක් වශයෙන් හෙගලියානු අපෝහකය හා දර්ශනය පිලිබඳ ගුනදෝෂ විචාරය* යනුවෙනි. පලමු විචාරය තුල වර්ධනය කරන ලද හෙගලියානු විධික්‍රමය පිලිබඳ විශ්ලේෂනය වඩාත් ගැඹුරු කරන මෙම අමිල කෘතියෙන් දීර්ඝ ලෙස උපුටා දැක්වීමට ඇති වන පෙලඹීම මා මැඩ ගන්නේ අමාරුවෙනි.

කෙසේ වුව ද එම විචාරය ලිවීමට හේතුව ලෙස මාක්ස් ගෙනහැර දැක් වූ, හේගල් හා ඔහු ගේ අනුගාමිකයන් ගෙන් තමාගේ වැඩ කටයුතු ප්‍රභේදනය කර දැක්වීම වැදගත් අවශ්‍යතාවක් වූයේ ය යන කාරනය අවධාරනය නොකර බැරිය. සිය ගුරුවරයා පිලිබඳව විවේචනාත්මක ආකල්පයක් ගැනීමට අසමත්වීම පිලිබඳව මාක්ස්, බෲනෝ බවර් වැනි ප්‍රකට වාම හේගලියානුවන්ට දොස් පවරයි. අනෙක් අතට ඔහු ෆොයබාක් ඉමහත් ප්‍රශංසාවට ලක් කරයි. "මෙම ක්ෂේත්‍රය තුල අව්‍යාජ හෙලිදරව්වන් කලා වූ ද හේගලියානු අපෝහකය කෙරෙහි බැරෑරුම් හා විවේචනාත්මක ආකල්පයක් ගන්නා වූ ද එක ම පුද්ගලයා" ලෙස ඔහු ෆොයබාක් අගය කරයි. "සැබවින් ම ඔහු පැරනි දර්ශනවාදය සැබවින්ම පරයා ලූ විජයග්‍රාහකයා ය." [*Economic and Philosophical Manucripts of 1844*, 1844 ආර්ථික හා දාර්ශනික අත්පිටපත්, මොස්කව් 1977 පි.133-] තමා හේගලියානුවෙකු ලෙස දිගින් දිගටම සලකා ගත්තා නම් මාක්ස් මෙතරම් අනුග්‍රහයක් ෆොයාබාක්ට දැක් වූයේ කුමක් නිසාද?

මාක්ස් හා එංගල්ස් විසින් සම්පාදනය කරන ලද ඊලඟ ශ්‍රේෂ්ඨ කෘතිය වන ශුද්ධ වූ පවුල ද රොක්මෝර් විසින් නො තකා හරිනු ලබයි, ඔහු මෙසේ ලියයි "බවර් හා අනෙකුත් වාම හේගලියානුවන්ට එරෙහිව ඉදිරිපත් කරන ලද වියලි තර්කයන්ගෙන් මෙම කෘතිය ගහන ය. තම හොඳම මට්ටමට එලඹුනු අවස්ථාවල දී (එනම් මාක්ස්, රොක්මෝර් සමග එකග වන විට) තමන් ගේ සැලකිල්ලට භාජනය වන කතුවරුන් ගේ විවිධ සූක්ෂම ඇඟැවුම්වලට සැලකිල්ලෙන් හා වහවහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාවකින් යුතු ලේඛකයෙකු වූ මාක්ස් අභිනිවේෂී ලේඛකයෙක් විය. එයට ප්‍රතිවිරුද්ධව සම්පූර්නයෙන් ම පාහේ විවාදාත්මක වන මෙම කෘතිය, තියුනු ප්‍රතිවිරුද්ධතාවයන් ගෙන් පිරුනු අවබෝධ කර ගැනීමට වඩා හෙලා දැකීමට යුහුසුලු වන, ඉන් පෙර හා පසු කල මාක්ස්වාදී ලේඛනවල දක්නට ලැබෙන සූක්ෂමතාවන් ගෙන් තොර සරල ලාභ (එනම් රොක්මෝර්ට එරෙහි වූ) අදහස්වලින් යුතු එකකි."(75)

රොක්මෝර්ට "සූක්ෂමාර්ථ" යන්නෙහි සැබෑ තේරුම වන්නේ මාක්ස් ගේ න්‍යායික කෘතීන්හි දක්නට නො ලැබෙන ලක්ෂනයක් වන දුරවබෝධතාවයයි. හේගල් පිලිබඳ මාක්ස් ගේ විචාරය කෙතරම් නම්

පැහැදිලිව නිර්වචිතව ඇත්දැයි කිවහොත් එය විකෘත කොට දුර්නියෝජනය කිරීම දුෂ්කර වේ.

මාක්ස් විසින් ඉදිරිපත් කරනු ලබන සංකල්ප හේගල් ගේ විඥ්ඤානවාදී සමපේක්ෂනයන් සමග සමනුගත වේ යැයි දැක්වීම සැබැවින්ම කල නොහැක්කකි. ශුද්ධ වූ පවුල කෘතිය, ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පය විස්තාරනය කිරීම දෙසට හා ධනේශ්වර සමාජය තුල වෛෂයික විප්ලවවාදී බලවේගය ලෙස නිර්ධන පන්තිය හඳුනා ගැනීමේ දැවැන්ත ඉදිරි පියවර නියෝජනය කරයි. සමාජයේ විප්ලවීය පරිනාමනයකට පදනම සපයනු ඇත්තේ මෙම පන්තියේ ද්‍රව්‍යමය භාවිතයෙනි; තාර්කික සංකල්පයන් ගේ ස්වයං චලනය විසින් නො වේ. සමාජ විප්ලවයේ සැබෑ පදනම රැඳී පවත්නේ කිසිදු තනි කම්කරුවකු ගේ චින්තනය තුල නොව, පන්තියක් ලෙස නිර්ධනයේ වෛෂයික සමාජ පැවැත්ම තුලයි. ජර්මානු කාල්පනික විඥානවාදය පිලිබඳ මාක්ස් ගේ විචාරයේ ඓතිහාසික ඇඟවුම් ඉස්මතු වන්නේ "එය වනාහී ඒ හෝ මේ නිර්ධනයා වේවා සමස්ත නිර්ධන පන්තිය හෝ වේවා මේ මොහොතේ තමන් ගේ කර්තව්‍යය ලෙස <u>සලකන්නේ</u> කුමක්ද යන්න පිලිබඳ ගැටලුවක් නො වේ. එය වනාහී <u>නිර්ධන පන්තිය යනු කුමක් ද මෙම සමාජ පැවැත්ම (භවය)</u> මගින් ඓතිහාසිකව එයට කරන්නට බල කෙරෙන්නේ කුමක් ද යන්න පිලිබඳ ගැටලුවයි. එහි ම ජීවිත තත්වය තුල මෙන් ම වර්තමාන ධනේශ්වර සමාජයේ සමස්ත සංවිධානය තුල ද නිර්ධනයේ අරමුන හා ඓතිහාසික ක්‍රියාව පිලිබඳ සහ පෙර ලකුනු අනුල්ලංඝනීයව පහල වී ඇත" යන්න මාක්ස් හා එංගල්ස් විසින් සොයා ගැනීම තුලයි... [Marx-Engels Collected Works, (මාක්ස් - එංගල්ස් එකතු කල කෘති, 4වන වෙළුම, නිව්යෝක්, 1974, 37.පිටුව)] නව විප්ලවවාදී පන්තියක් ලෙස නිර්ධන පන්තිය නැගී ඒම යන කරුන මාක්ස් හා එංගල්ස් ගේ රචනයන් තුල සවිඥානික න්‍යායික ප්‍රකාශනයක් අත්කර ගන්නාවූ මෙම තීරනාත්මක ඡේදය, රොක්මෝර් විසින් උපුටා දක්වනු නො ලැබීම පුදුමයක් නො වේ. ඔහුට එය " ශුෂ්ක" වැඩිය, සූක්ෂම භාවයෙන් තොරය; " විවාදාත්මකය" "අති සරල" වන හෙයින් සඳහන් කිරීමට වත් "නො තරම්" ය.

රොක්මෝර් නොතකා හැරීමට තෝරාගන්නා තවත් තීරනාත්මක අංශයක් වන්නේ නූතන භෞතිකවාදයේ පරිනාමය පිලිබඳව <u>ශුද්ධ වූ පවුල</u> කෘතියේ එන දිගු කොටසයි. "භෞතිකවාදය එංගල්ස් තුල කැපී පෙනෙන ධර්මතාවක් වන නමුත් මාක්ස් තුල අපැහැදිලි ය"(5) යි කල්තබාම නිවේදනය කර තිබෙන ඔහුට, දහහත්වන ශතවර්ෂයේ පටන් සිදු වූ නූතන භෞතිකවාදයේ වර්ධනය හා සමාජවාදී චින්තනයේ වර්ධනයට එමඟින් ඉටු කල ප්‍රගාඪ ප්‍රතිපදානයන් පිලිබඳව <u>ශුද්ධ වූ පවුල</u> කෘතිය තුල මාක්ස් විසින් ම ලියන ලද දීප්තිමත් කෙටි විචාරය පිලිගත නො හැක:

"කාටීසියානු භෞතිකවාදය නියම <u>ස්වභාවික විද්‍යාවන්</u> කරා ගමන් කරන්නේ යම් සේ ද එසේ ම ප්‍රන්ස භෞතිකවාදයේ අනෙක් ධාරාව සෘජුව ම <u>සමාජවාදය</u> හා <u>කොමියුනිස්ට්වාදය</u> කරා ඉදිරියට යයි.

"මිනිසුන්ගේ ප්‍රාරම්භ යහපත් බව හා සමාන බුද්ධිමය ශක්‍යතාවය, අත්දැකීමේ අධ්‍යාපනයේ පුරුද්දේ හා සර්වබලධාරීත්වය, මිනිසා කෙරෙහි පරිසරයේ බලපෑම, කර්මාන්තයේ ඉමහත් අර්ථභාරය, ප්‍රීතිය භුක්තිවිඳීම යුක්ති සහගත කිරීම ආදිය ද භෞතිකවාදය, කොමියුනිස්ට්වාදය හා සමාජවාදය සමග අවශ්‍යයෙන්ම සම්බන්ධ වී තිබීම ද යන්න පිලිබඳව භෞතිකවාදී උගැන්වීම දැක ගැනීමට කිසිදු තීක්ෂන විනිවිද දැක්මේ හැකියාවක් අවශ්‍යවන්නේ නැත. මිනිසා සිය සකලවිධ ඥානය ද සංවේදන ද උපුටා ගන්නේ ඉන්ද්‍රියයන් ගේ ලෝකයෙන් හා එය තුල දී ලබා ගන්නා අත්දැකීමෙන් නම්, කල යුතුව පවතින්නේ, අනුභූතික ලෝකය තුල ඇති යථා මානුෂික දෙය මිනිසාට අත්දැකීමට ලැබෙන හා එයට ඔහු හුරු පුරුදු වන ආකාරයට ද ඔහු තමන්ව ම මිනිසකු යයි දැන ගන්නා ආකාරයට ද එම ලෝකය සකස් කිරීමයි." [*Marx-Engels Collected Works,* මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති (4වන වෙලුම, 130 පිටුව]

හේගල් ගේ විඥ්ඤානවාදය පිලිබඳව මාක්ස්ගේ විවේචනය කෙරෙහි රොක්මෝර් දක්වන නොතැකීමේ විපාකයක් ලෙස රොක්මෝර්ට, විද්‍යාත්මක දේශපාලන අර්ථ ශාස්ත්‍රයේ සංවර්ධනයට එම විවේචනය මගින් කල සාරභූත ප්‍රතිපදානය තබා ධනේශ්වර සමාජය පිලිබඳ මාක්ස් ගේ න්‍යායේ පදනම් වත් අවබෝධ කර ගැනීමට නො හැකි ය. ඔහු ලියන පරිදි:

"ඔහු (මාක්ස්) ගේ ම ආර්ථික න්‍යායේ කේන්ද්‍රීය අදහස වනාහී වටිනාකම පිලිබඳ න්‍යායවත්, භාන්ඩ පිලිබඳ විග්‍රහයවත්, ඔහුගේ පරත්වාරෝපන සංකල්පයවත් භාන්ඩ වන්දනාව පිලිබඳ ඔහු ගේ දෘෂ්ටියවත් නො වේ. ඒ වෙනුවට එය වනාහි, ඇඩම් ස්මිත් මත පදනම් වූ ද හේගල් විසින් පාර්ශවිකව වර්ධනය කරන ලද්දා වූ ද නවීන සමාජය වූ කලී, ධනේශ්වර ලෝකයේ ආර්ථික රාමුව තුල, තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා තනි මිනිසුන් දරන ප්‍රයත්නයන් ගෙන් පැන නගින සංක්‍රමනීය අවධියක් ය යන තීරනාත්මක සුවිශේෂ අභිනිවේෂයකි."(xvi)

හේගල්ගේ හා ඇඩම් ස්මිත්ගේ [තම <u>අතිරික්ත වටිනාකමේ න්‍යායන්හි</u> පිටු සිය ගනනක්, මාක්ස් මොහුට කැප කලේය] ලියවිලි පිලිබඳව වෙහෙස නො තකා කල විශ්ලේෂනයන් මගින් මාක්ස් රැස් කර ගත් "සුවිශේෂී අභිනිවේෂය" ලෙස අත යටින් පාස්කර

ඇත්තේ, උසස් පාඨශාලීය ගෘහ ආර්ථික විද්‍යා පන්තියේ දී දක්නට ලැබෙන ජාතියේ වැදගැම්මකට නැති කතාවකි. ඉන් කියැවෙන්නේ නූතන සමාජය සැදී ඇත්තේ ජීවත් වීමට වෙර දරන තනි පුද්ගලයන් ගෙන් ය යන ලාබ කතාවය.

කෙසේ වෙතත් මෙම ග්‍රාම්‍ය නිරීක්ෂනය ද රොක්මොර් විසින් මාක්ස්ගේ න්‍යායික සංවර්ධනය විකෘති කරනු ලැබීම ද අතර සබඳතාවක් ඇත. කාල්පනික විඥ්ඤානවාදය ගැන විචාරයකින් ද හේගලියානු අපෝහකය භෞතිකවාදීව යලි පිහිටු වීමකින් ද තොරව, විස්තාරනය කල නො හැකි වූ සමස්තයක් ලෙස ධනේශ්වර සමාජය පිලිබඳ මාක්ස්ගේ පොදු න්‍යායයේ අතිශයින් ම වැදගත් අංග සියල්ලක් ම රොක්මෝර් විසින් නො තකා හරිනු ලැබේ. ඇත්ත වශයෙන් ම 1844 දී ආරම්භ වූ මාක්ස්ගේ "ආර්ථික හැරීම" අවශ්‍යයෙන් ම ගලා ආවේ, හේගල් විසින් තාර්කික ප්‍රවර්ගයන්ගේ චලනයෙන් ලෝකය ව්‍යුත්පන්න කිරීම පිලිබඳව මාක්ස් දරා සිටි විවේචනාත්මක ආකල්පයෙනි. මානව සමාජයේ සැබෑ පදනම් ද සමාජ විඥ්ඤානයේ නිශ්චිත රූපාකාරයන් තුල එහි අවශ්‍ය පිලිබිඹු වීම් ද පිලිබඳ භෞතිකවාදී විග්‍රහයක් සඳහා දර්ශනවාදය එහි අවධානය, දිව්‍ය ලෝකයෙන් මහ පොලොවටත් (හේගල්ගේ පරම චෛතන්‍යමය දාර්ශනික දෙවියන් වහන්සේ ද ඇතුලත්) සකල වර්ගයේ දෙවියකුගෙන් මිනිසා වෙතත්, පාරිශුද්ධ චින්තනය පිලිබඳ වියුක්ත අවලෝකනයෙන් මානව සමාජයේ නිර්මානයේ, ප්‍රතිනිෂ්පාදනයේ හා සංස්කෘතිකමය සංවර්ධනයේ යථා පදනම ලෙස ශ්‍රම ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීමටත් යොමු කල යුතු විය.

## භෞතිකවාදයට එරෙහි විඥ්ඤානවාදය

මාක්ස් ගේ විචාරයෙහි පරිපූර්නත්වය හා නිශ්චිතභාවය මධ්‍යයේ වුව, වචන මෝඩ ලෙස හරඹ කරමින් මාක්ස් සත්‍ය වශයෙන් ම හේගල් ගෙන් බිඳී වෙන් නො වුනු විඥ්ඤානවාදී දර්ශනවාදියකු වී ය යන තම අර්ථකථනය ආරක්ෂා කර ගැනීමට රොක්මෝර් වෙරදරයි. "විඥ්ඤානවාදය යනුවෙන් අප තේරුම් ගන්නේ ආත්මීයය කිසියම් අර්ථයකින් තම ලෝකයත් තමන්ව මත් නිෂ්පාදනය කරති යි යන අදහස නම්, එවිට මාක්ස් පැහැදිලිව ම විඥ්ඤානවාදියෙකි"යි ඔහු ලියයි.(70) වෙනත් වචනවලින් කියතොත්, විඥ්ඤානයක් උරුමව ඇති මනුෂ්‍ය වර්ගයා ලෝකය මත ක්‍රියා කරමින් ඒ හරහා ලෝකය හා තමන්ව ම වෙනස් කර ගන්නා බව පිලිගන්නා ඕනෑ ම අයෙක් විඥ්ඤානවාදියෙකි. විඥ්ඤානවාදය හා භෞතිකවාදය අතර ගැටුමට අදාල වූ කේන්ද්‍රීය කාරනා මග හරින මෙම අර්ථ දැක්වීම විවිධාකාර හා සමහන් කල නො හෙන දාර්ශනික දෘෂ්ටීන් එකට ගැටගැසීමට ඉඩ සලසනු ඇත. රොක්මෝර් ගේ අර්ථ දැක්වීම අවධාරනය කරන්නේ විඥ්ඤානය ඉතිහාසය තුල ක්‍රියාකාරී හා නිර්මානාත්මක බලයක් බව පිලිගන්නා සියලු දාර්ශනික ප්‍රවනතාවන් විඥ්ඤානවාදය, තුලට ඇතුලත් කර ගන්නා බවයි.

එහෙත් මෙම අර්ථ දැක්වීම තීරනාත්මක හා අන්තර් සම්බන්ධිත දාර්ශනික ප්‍රශ්නයන් දෙකකට පිලිතුරු නො දී මග හරියි. චින්තනය හා ද්‍රව්‍යය අතර සම්බන්ධය පලමුවැන්නයිඃ එය පහත සඳහන් ගැටලු ඉදිරිපත් කරයි. විඥ්ඤානයෙන් ස්වාධීනව ද්‍රව්‍යය පවතින්නේ ද, නැතහොත් ද්‍රව්‍යයෙන් ස්වාධීන විඥ්ඤානය පැන නගී ද? විඥ්ඤානයට පූර්වයෙන් ද්‍රව්‍යය පවතී ද නැතහොත් සිදුවන්නේ එහි අනෙක් පැත්ත ද? ද්‍රව්‍යමය ලෝකය, විඥ්ඤානය සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් ද නැතහොත් ද්‍රව්‍යමය ලෝකය නොමැතිව හෝ ඉන් ස්වාධීනව විඥ්ඤානයට (හෝ අධ්‍යාත්මයට ) පැවතිය හැකි ද? විශ්වයේ නිර්මානය විඥ්ඤානය පහලවීමට පෙර සිදු වුනි ද? නැතහොත් විශ්වයේ ආරම්භයට පෙර සිට ම විඥ්ඤානය පැවතුනි ද? පලමුවැන්න තුල ම මුල්බැස පවතින දෙවැන්න නම්, ඥානන සන්තතියේ ස්වභාවය හා විශ්වාසනීයත්වය සම්බන්ධ ගැටලු ඉස්මතු කරයි - . එනම් මනසට තමන්ට පිටින් පවතින දෑ පිලිබඳව දැන ගත හැක්කේ කවර ප්‍රමානයකට ද? චින්තනයට යථාර්ථය පිලිබඳ නිවැරදි ඉදිරිපත් කිරීමක් කල හැකි ද?

විවිධ දාර්ශනිකයන් අයත් වන්නේ විඥ්ඤානවාදයේ කඳවුරට ද භෞතිකවාදයේ කඳවුරට ද යන්න තීරනය වන්නේ ඔවුන් මෙම ගැටලුවලට දෙන පිලිතුරු මත ය. එක් හෝ තවත් ආකාරයකින් ද්‍රව්‍යය මත චින්තනයේ හා පැවැත්ම මත විඥ්ඤානයේ ප්‍රාථමිකත්වය අවධාරනය කරන අය විඥ්ඤානවාදීහු වෙති. එම ආස්ථානයට ප්‍රතිවිරුද්ධව විඥ්ඤානය මත ද්‍රව්‍යයේ ප්‍රාථමිකත්වය හා විඥ්ඤානය ඉස්මතු වූයේ ද්‍රව්‍යයේ පරිනාමයේ නිෂ්පාදනයක් ලෙස ය යන්න අවධාරනය කරන අය භෞතිකවාදීහු ය.

විඥ්ඤානවාදය පිලිබඳ රොක්මෝර්ගේ අර්ථ දැක්වීම හුදෙක් ප්‍රමුඛ දාර්ශනික ගැටලු ව්‍යාකූල කිරීම ඉලක්ක කරගත් ප්‍රයෝගයකි. තව ද, මනුෂ්‍ය වර්ගයා ක්‍රියාකාරී වන්නේ විඥ්ඤානයත් සමගය යන අවිවාදිත කරුන තුලින් විඥ්ඤානවාදය සඳහා සාමාන්‍ය පදනමක් සොයා ගන්නා ප්‍රථමයා ද ඔහු නො වේ. එංගල්ස් පෙන්වා දුන් පරිදි, "මිනිසා අභිප්‍රේරනය කරන සෑම දෙයක් ම ඔහුගේ මොලය හරහා ගමන්කල යුතු බව - සාගින්න හෝ පිපාසාව පිලිබඳ සංවේදනයන් මොලය හරහා සම්ප්‍රේෂනය වීමෙන් ආරම්භ වී ඒ ආකාරයට ම කෑම බීම මගින් තෘප්තිමත් වීම පිලිබඳ සංවේදනයන් මොලය හරහා සම්ප්‍රේෂනය වීමෙන් අවසන් වන හැඟීම් ද ඇතුලුව - අපට සැඟවිය නො හැකි ය. මිනිස් මොලය තුල ප්‍රකාශයට පත්වන මිනිසා

මත බාහිර ලෝකයේ බලපෑම් හැඟීම්, චින්තා ආවේගී චේතනා - එක් වචනයකින් කියන්නේ නම් "ආත්මීය ප්‍රවනතා" ආදිය ලෙස පිලිබිඹු වෙමින් එම රූපයෙන් "ආත්මීය බලයන්" බවට පත්වෙයි. එවන් තතු තුල මිනිසෙකු "ආත්මීය ප්‍රවනතා" අනුගමනය කරන නිසා "ආත්මීය බලයන්" ඔහු මත අධිකාරයක් දරන බව පිලිගන්නා නිසාත්, ඔහු විඥ්ඥානවාදියෙකු ලෙස විනිශ්චය කරනු ලබන්නේ නම් එවිට සාමාන්‍ය වර්ධනයක් දරන්නාවූ සෑම පුද්ගලයෙකුම උත්පත්තියෙන්ම විඥ්ඥානවාදියෙකු වන්නේ ය. එකල්හි භෞතිකවාදී වන කිසිවෙක් සිටිය හැකි ද? " [Marx-Engels Collected Worksල (මාක්ස් එංගල්ස් එකතු කල කෘති, 26 වෙලුම, මොස්කව්, 1990, 373 පිටුව )]

භෞතිකවාදය හා විඥ්ඥානවාදය අතර පවත්නා විවාදයේ දී ප්‍රස්තුත වන ප්‍රයුක්තය වනාහී " ආත්මීය බලයන්" පැවතීම හෝ ඒවා මිනිසා මත ඇති කරන බලපෑම පිලිගැනීම නොවේ; මෙම "ආත්මීය බලයන්ගේ" උල්පත් හා ඒවායේ ස්වභාවය ග්‍රහනය කරන්නේ හා විග්‍රහ කරන්නේ කෙසේ ද යන්නයි. අවසාන විග්‍රහයේ දී "ආත්මීයයේ" උල්පත සොයා ගත යුත්තේ මනසට පරිබාහිරව වෛෂයිකව පවත්නා ද්‍රව්‍යමය ලෝකයක් තුල ද නැද්ද යන මතය.

"විෂය වස්තුවේ ජීවිතය දර්පනයක් තුලින් මෙන් වෛඥානිකව පිලිබිඹු කරනු ලබන්නේ නම්, එවිට එය පෙනී යනු ඇත්තේ හරියට ම අප ඉදිරියේ හුදෙක් ප්‍රාගානුභූත නිර්මිතයක් පවත්නාක් මෙන්" යයි මාක්ස් මෙම ගැටලුවට පිලිතුරු වශයෙන් තිරසාරව හා පැහැදිලිව දෙවන ජර්මානු සංස්කරනයට දුන් භෞතිකවාදී පිලිතුර අපරූපනය කිරීමට රොක්මෝර් යලි යලිත් යත්න දරයි. නිදසුනක් වශයෙන් ප්‍රාග්ධනය කෘතිය ලිවීමේ දී අනුගමනය කල විධික්‍රමය පිලිබඳව සාකච්ඡා කරන රොක්මෝර් මාක්ස්ගේ 'කැපිටාල්' ග්‍රන්ථයේ දෙවන ජර්මානු මුද්‍රනයේ පසුවදනෙන් පහත සඳහන් පරිදි උපුටා දක්වයි.

"මෙහි මාක්ස්ගේ වචන පහසුවෙන් ම වැරදි වැටහීමක් ජනනය කරයි. පැහැදිලිව ම ඔහු, මෙහිලා එංගල්ස් මූලිකත්වය ගෙන මාක්ස්වාදයට ඇතුලත් කල ඥානය පිලිබඳ ප්‍රකාශන න්‍යායට සහාය නො දක්වයි. ඥානය උදෙසා සැබැවින් ම ස්වාධීන ලෝකයක සැබෑ පිලිබිඹුවක් මනස විසින් අවශ්‍යයෙන්ම කල යුතු යයි මාක්ස් නො කියයි." (131) නැවත වතාවක් රොක්මෝර්ගේ උත්සාහය වන්නේ මාක්ස්ගේ භෞතිකවාදය ප්‍රතික්ෂේප කොට, මාක්ස්ගේ අදහස්, එංගල්ස්ගේ අදහස්වලට එරෙහිව ප්‍රයෝගකාරීව පිහිටුවාලීමටයි. "අවශ්‍යයෙන් ම" යන වචනය යොදා ගෙන ඇත්තේ ව්‍යාකූලත්වයක් නිර්මානය කිරීමේ ඇමක් ලෙසය. තීරනාත්මක කරුන වන්නේ මනස ස්වාධීන ලෝකයක් පිලිබිඹු කරයි ද නැද්ද යන්නයි. ද්‍රව්‍යමය ලෝකය පිලිබිඹු කෙරන ආත්මීය රූපාකාරයන් සංකීර්න හා පරස්පර විරෝධී වේ. මිනිස් මනස තුල යථාර්ථයේ ආත්මීය ප්‍රතිනිෂ්පාදනය ඓතිහාසික හා සමාජීයව සැකැසුනු වියුක්තීකරන සන්තතියක් තුලින් ගමන් කරයි. මෙම සුවිශේෂී අර්ථයෙන් ගත් කල්හි ක්ෂනිකව පිලිබිඹුවීමේ පදනම මත එහි සියලු සංකීර්නත්වයන් සහිතව යථාර්ථය පිලිබිඹු කරන හුදු " දර්පනයක්" ලෙස මනස ක්‍රියාත්මක වන්නේ නැත. [දෙවන සටහනේ අවසානය] එසේ වූවත් අවසාන විග්‍රහයේ දී, මිනිස් මනස තුල මතුව එන ප්‍රතිබිම්බනයන් චින්තා හා සංකල්ප වනාහි ඥානනයේ යෙදී සිටින කතෘගේ මනසට පිටතින් පවතින වෛෂයික යථාර්ථයක පිලිබිඹු ය.

රොක්මෝර් උපුටා දක්වන ප්‍රාග්ධනයේ පසුවදනේ එන මාක්ස්ගේ එම වචන පලවන්නේ මාක්ස්ගේ සමකාලීන විශ්ලේෂකයෙකු විසින් රුසියානු සඟරාවකට ගෙන හැර දැක් වූ මාක්ස්ගේ දාර්ශනික දෘෂ්ටිය හා විශ්ලේෂනාත්මක විධික්‍රමය පිලිබඳ දීර්ඝ ඡේදයක අගදී ය. මාක්ස් විසින් ප්‍රශංසාත්මකව උපුටා දැක්වෙන එම විමර්ශනයේ කොටසක සඳහන් වන පරිදි

"මනුෂ්‍ය අභිප්‍රායෙන්, විඥ්ඥානයෙන් හා බුද්ධියෙන් ස්වාධීන වන්නා වූ පමනක් නොව එම අභිප්‍රාය, විඥානය හා බුද්ධිය තීර්නය කරන නීති නියාම මගින් පාලිත වූ ස්වභාවික ඓතිහාසික ක්‍රියාදාමයක් ලෙස ය මාක්ස් සමාජීය චලනය සලකන්නේ... ශිෂ්ටාචාරයේ ඉතිහාසය තුල විඥ්ඥානය ඉටු කරන්නේ එතරම් ම ද්විතීයක ක්‍රියාකලාපයක් නම් ශිෂ්ටාචාරය තම විෂය පදාර්ථය කරගත් විවේචනාත්මක විශ්ලේෂනයකට විඥ්ඥානයේ කවර රූපාකාරයන් හෝ කවර ප්‍රතිඵලයක් සිය පදනම කරගත හැක්කේ අන් කවරකටත් වඩා අඩු වශයෙන් බව ස්වයං විෂද ය. එනම් ආරම්භක ලක්ෂ්‍ය ලෙස කටයුතු කල හැක්කේ ද්‍රව්‍යමය ප්‍රපංචයට මිස අදහසට නො වන බවයි." [*Capital*, (ප්‍රාග්ධනය, 1 වෙලුම, 27 පිටුව)]

රොක්මෝර් මෙම ඡේදය උපුටා නො දැක්වීමට ඉටා ගනී.

ඒ වෙනුවට රොක්මෝර් "තමන්ව හේගලියානුවෙක් ලෙස ප්‍රකාශ කිරීම මගින් මාක්ස් දැනටම පැහැදිලිව ඇති දෙය යලිතහවුරු කරයි" යනුවෙන් කියා පාමින් පසුවදන පිලිබඳ තම මෙට්ටැහි විශ්ලේෂනය හමාර කරයි. ඇත්ත වශයෙන් ම නම් මාක්ස් තමන්ව ම විස්තර කර ගන්නේ හෙගලියානුවෙක් ලෙස නොවේ, නිශ්චිතව හා නිවැරදිව-විඥානවාදී ගුරුවරයා ගෙන් භෞතිකවාදී ශිෂ්‍යයා වෙන්වන්නේ කුමක් මගින් ද යන්න සවිස්තරව විග්‍රහ කරන මාක්ස් තමා - "එම යෝධ චින්තකයාගේ ශිෂ්‍යයෙකු" යයි කියා සිටින්නේ එම සීමාවතුල ය.

"හේගල්ගේ අතේදී අපෝහකය අත්විඳින්නාවූ ගූඪ කරනය හේතු කොට ගෙන එය (අපෝහකය - පරිවර්තක) ක්‍රියාත්මක වන්නා වූ පොදු රූපාකාරය පරිපූර්න හා සවිඥානක ආකාරයකින් ඉදිරිපත් කල ප්‍රථමයා ඔහු ය යන්න කිසිදු අයුරකින් වෙනස් වන්නේ නැත. එය (අපෝහකය) ඔහු අත පවතින්නේ ඔළුවෙන් සිටගෙන ය. ගූඪ පිටස්තර කටුව තුලින් තාර්කික සාරය සොයා ගැනීමට නම් ඔබ එය යලිත් නිවැරදිව සිටුවා ගත යුතු ය." යනුවෙන් ප්‍රකාශ කරන මාක්ස් හේගල්ගේ විධික්‍රමයට තම විධික්‍රමයේ ඇති සම්බන්ධය විවරනය කිරීම සමාප්තියකට ගෙන එයි. [*Capital*, (ප්‍රාග්ධනය, 29 පිටුව)]

"මාක්ස් පැහැදිලිව ම විඥඥානවාදියෙකි"(70) හා "මාක්ස්වාදයෙන් පැහැදිලිව ම වෙනස්වන ඔහු මාක්ස් වනාහී විඥඥානවාදයට කැප වී සිටි අයෙකි" (179) යන  රොක්මෝර් ගේ අභ්‍යර්ථනයන්, මාක්ස් 1843 සිට 1883 ඔහුගේ අභාවය තෙක් දරා සිටි දාර්ශනික ආස්ථානය පිලිබඳ තුච්ඡ හා පැහැදිලි මුසාකරනයක් බව දැන් ඇති තරමින් පැහැදිලි විය යුතු ය. කෙසේ වෙතත්, මෙම නිශ්චිත තර්කය, විසඳලීම සඳහා නැවතත් මාක්ස්ට තමා වෙනුවෙන් ම කථා කිරීමට ඉඩදීම යෝග්‍ය ය. 1868 මාර්තු 6 වැනි දා මාක්ස් තම මිත්‍ර ලුද්විග් කුගෙල්මාන්ට ලියූ ලිපියක් තුල, මහාචාර්ය ඉයුජින් ඩූරිං (පසුව එංගල්ස් ගේ අමරනීය විවාද ග්‍රන්ථය (ඇන්ටි-ඩූරිංහි) විෂය -බවට පත් වූ) විසින් ලියන ලද <u>ප්‍රාග්ධනය</u> පිලිබඳ විමර්ශනයන් තියුනු ලෙස විවේචනය කලේය. ඩූරිං "වංචනිකව කටයුතු කරන" බවට චෝදනා කරන මාක්ස්, "මා භෞතිකවාදියෙකු ද හේගල් විඥඥානවාදියෙකු ද වන නිසා මගේ විචාර ක්‍රමය හෙගලියානු ක්‍රමය <u>නො වන</u> බව ඔහු හොඳින් ම දන්නේ ය"යි මාක්ස් සටහන් කරයි. සියලු අපෝහකයන්ගේ ම මූලික රූපාකාරය වන්නේ හේගල්ගේ අපෝහකයයි. එහෙත් එසේ වන්නේ එය එහි ගූඪත්වයෙන් මුදාගනු ලැබීමෙන් <u>පසුව</u> පමනි, <u>මගේ</u> විධික්‍රමය වෙන්ව නැගී සිටින්නේ හරියට ම මේ අයුරිනි." [*Marx- Engels Collected Works*, (මාක්ස් - එංගල්ස් එකතු කල කෘති, 42 වෙලුම, නිව්යෝක්, 1987, 544 පිටුව) අවධාරනය මුල් කෘතියේ]ග

සිය කෘතිය ලිවීම සඳහා සූදානම් වීමේ දී මහාචාර්ය රොක්මෝර්ට මෙම සුප්‍රකට ලිපිය මූන නො ගැසුනේ යයි විශ්වාස කිරීම දුෂ්කර ය. ඇත්තෙන් ම නම්, ඔහු එය සරලව ම ලිස්සා හැරීමට අදිටන් කර තිබේ. එබැවින් මාක්ස්, ඩූරිංට එරෙහිව නගන චෝදනාව රොක්මෝර් ගේ දොරකඩ ද තැබිය හැකිය.

## මාක්ස් නම් ප්‍රතිසංස්කරනවාදියා?

එසේ නම්, මාක්ස් හේගලියානු විඥඥානවාදියෙක් ලෙස යලි අත්පත් කර ගනිමින් ඔහු, එංගල්ස්ගෙන් මෙන් ම මාක්ස්වාදයෙන් ද වෙන් කිරීමට රොක්මෝර් දරන වේදනාකාරී ප්‍රයත්නයේ අරමුන කුමක් ද? මෙයට පිලිතුර ලැබෙන්නේ රොක්මෝර්ගේ පොතේ අග දී ය. සමාජ විප්ලවයේ අවශ්‍යතාව පිලිබඳව තමන් කලින් දැරූ මත මාක්ස් බැහැර කලේය යි තහවුරු කිරීමට ප්‍රාග්ධනයේ තුන්වන වෙලුමෙන් "හිරිවට්ටන ඡේදයක්" සොයා ගැනීමට තමා සමත්ව ඇතැයි රොක්මෝර් කියාපාන විට එය පැහැදිලි වේ. ඔහු මෙසේ ලියයි: "මාක්ස්ට අනුව බලහත්කාරී ශ්‍රමය අවසන් වූ විට පමනක් ඇරඹෙන නිදහස ඇරඹෙන්නේ මනුෂ්‍ය වර්ගයාට වාසිදායක වන කොන්දේසි යටතේ ආර්ථික ක්‍රියාවලිය පිලිබඳ ආධිපත්‍යය තහවුරු කිරීම තුලය. වර්තමානයේ මෙන් ම අනාගතයේ දී ද සැබෑ අවශ්‍යතා ආර්ථික ක්‍රියාවලිය මඟින් සාක්ෂාත් කර ගැනීම අවශ්‍ය වන නමුදු මාක්ස් නිදහසේ රාජධානිය නමින් හඳුන්වන දෙය පවත්නේ ඉන් ඔබ්බෙහි ය. එහි පූර්වාවශ්‍යතාව වැඩ දිනය කෙටි කිරීම තුල රැඳී තිබෙන බව කියා සිටීම මඟින් ඉතිහාසයේ අරමුන ලෙස මාක්ස් ගම්‍ය කරන්නේ සැබෑ නිදහස විවේක කාලය තුල පවතින බවය". (173)

ඉන් පසු ඔහු මාක්ස් ගෙන් දීර්ඝව උපුටා දක්වයිථ

"ඇත්ත වශයෙන් ම නිදහසේ රාජධානිය සැබැවින්ම ඇරඹෙන්නේ ආවශ්‍යකත්වය හා ලෞකික උත්සුකයන් මඟින් නිර්නිත ශ්‍රමය අවසන් වන තැන දී ය; දේවල්වල ස්වභාවයට ම අනුව එය පවතින්නේ සැබෑ ද්‍රව්‍යමය නිෂ්පාදනයේ ක්ෂේත්‍රයට ඔබ්බෙන් ය. ම්ලේච්ඡයා තම අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීම ම, තම ජීවිතය නඩත්තු කර ගැනීමට හා ප්‍රතිනිෂ්පාදනය කිරීමටම ස්වභාව ධර්මය සමග පොර බැදිය යුතු වූවා සේ ම ශිෂ්ට වූ මනුෂ්‍යයා ද එසේ කල යුතු අතර සියලු සමාජ ආකෘතීන් ද පැවතිය හැකි සියලු නිෂ්පාදන ක්‍රම යටතේ ද ඔහු එසේ කල යුතු ය. ඔහුගේ සංවර්ධනයත් සමග ඔහුගේ අවශ්‍යතාවල [පුලුල්වීමේ - පරිවර්තක] ප්‍රතිඵලයක් ලෙස ශාරීරක ආවශ්‍යකත්වයේ මෙම රාජධානිය ද පුලුල් වේ; එහෙත් ඒ සමග ම මෙම අවශ්‍යතා තෘප්තිමත් කරනු ලබන නිෂ්පාදන බලවේග ද ප්‍රසාරනය වේ. මෙම ක්ෂේත්‍රයේ නිදහස සමන්විත විය හැක්කේ සාමාජික මිනිසා හෙවත් සාමූහික නිෂ්පාදකයා ස්වභාව ධර්මයේ අන්ධ බලවේග විසින් පාලනය වනු වෙනුවට, ස්වභාව ධර්මය සමග තම අන්තර් ක්‍රියාකාරිත්වය තර්කානුකූලව පාලනය කරගනිමින් එය තම පොදු පාලනය යටතට ගෙන ඒම මගිනි; තම මානුෂික ස්වභාවයට වඩාත් ම හිතකර සහ යෝග්‍ය කොන්දේසි යටතේ අවම ශක්තියක් වැය කරමින් <u>එය</u> සාක්ෂාත් කර ගැනීම තුල පමනි. එසේ වූවත් එය තවමත්  අවශ්‍යකතාවේ රාජධානියක් ලෙස පවතී. එයම (මානව ශක්තියේ වර්ධනයම) අරමුනු කර ගන්නා මානව ශක්තියේ වර්ධනය ආරම්භවන්නේ ඉන් ඔබ්බෙහි දී ය. කෙසේ වුව ද නිදහසේ සැබෑ

රාජධානියට විකසිත විය හැක්කේ ආවශ්‍යකතාවේ රාජධානිය සිය පදනම ලෙස ගත්විට පමණකි. එහි පාදකම පූර්වාවශ්‍යතාව වන්නේ වැඩ දිනය කෙටි කිරීමයි. [*Rockmore* 173, (රොක්මෝර් ගේ කෘතියේ 173 පිටුව; මෙම ඡේදය ප්‍රාග්ධනය 3 වෙලුමේ අඩංගුවේ. ලන්ඩන්, 1974, 820 පිටුව )].

රොක්මෝර් උකහා ගන්නා නිගමනය, මාක්ස් සැබැවින් ම ලියූ දෙය මගින් අවම වශයෙන් හෝ යුක්ති සහගත කෙරේ දැයි පාඨකයාට ම නිගමනය කිරීමට හැකිවනු පිනිස ඔහු උපුටා දක්වන මාක්ස්ගේ සම්පූර්න ඡේදයම මම මෙහි ඉහත ඉදිරිපත් කර ඇත්තෙමි.

රොක්මෝර් මෙසේ ලියයි: "මෙම චිත්තාරාධනීය ඡේදය පිලිබඳ බොහෝ දේ කිව හැකිය. ඉන් වඩාත් ම පැහැදිලි දෙය වන්නේ, මාක්ස් බොහෝ වසර ගනනක් කොමියුනිස්ට්වාදය සඳහා අරගල කිරීමෙන් පසුව, මෙහිදී එතරම්ම පැහැදිලිව පෙනී යන පරිදි තව දුරටත් එය (කොමියුනිස්ට්වාදය) සැබෑ මානුෂික නිදහස සඳහා පූර්ව කොන්දේසියක් සේ නො සලකන බවයි. තවදුරටත් නිදහස රැඳී පවතින්නේ පූර්ව සමාජ අවධියෙන් බිඳී වෙන්වීම, එනම් විප්ලවය, තුල නොව ජීවන තත්වයන්ගේ මූලික අභිවෘද්ධිය හෙවත් ප්‍රතිසංස්කරනය තුලයි. එය වචනයකින් කිවහොත් මෙහි දී මාක්ස් විප්ලවය වෙනුවට ප්‍රතිසංස්කරන ආදේශ කරයි" (173 ),

මෙම ඡේදය පිලිබඳව බොහෝ දේ කිව හැකි බව සත්‍ය ය; එහෙත් රොක්මෝර් කියන කිසිවක් නම් නිවැරදි නොවේ. ප්‍රතිසංස්කරනයට හිතකර ලෙස විප්ලවය ප්‍රතික්ෂේප කිරීමක් මෙම ඡේදය තුලින් සොයා ගැනීමට නම් යමෙකු මෙහි එන සෑම වාක්‍යයකට ම එහි ප්‍රතිවිරුද්ධ අර්ථය ආරෝපනය කල යුතුය. මාක්ස් නිවේදනය කරන්නේ "නිදහස" සාක්ෂාත් කල හැක්කේ "ස්වභාව ධර්මයේ අන්ධ බලවේග විසින් පාලනය වනවා වෙනුවට, ස්වභාව ධර්මය සමග අන්තර් ක්‍රියාකාරිත්වය තර්කානුකූලව පාලනය කරමින් එය තම පොදු පාලනය යටතට ගෙන එන සාමාජගත මිනිසා හෙවත් සාමූහික නිෂ්පාදකයන්" විසිනි.... සර්වබලධාරී වෙලඳපොලේ ස්වරූපයෙන් ආර්ථික ආරාජිකත්වය රජයන නිෂ්පාදනය ක්‍රමය වන ධනවාදය පෙරලා දැමීම මගින් හැර අන් ලෙසකින් මෙය ලඟා කර ගත නොහැකිය. ජීවිතය පවත්වා ගැනීමට හා ප්‍රතිනිෂ්පාදනය කිරීමට ඇති අවශ්‍යතාවය මගින් නියම කරනු ලබන කාර්ය ක්ෂේත්‍රයෙන් ඔබ්බට මිනිසාගේ නිර්මානාත්මක ධාරිතාවන් වර්ධනය වීම සාක්ෂාත් කර ගනු ලබන නිදහස, මෙම පදනම මත ප්‍රසාරනය වනු ඇත. මිනිසාට සිය පැවැත්ම හා ප්‍රතිනිෂ්පාදනය සඳහා අවශ්‍ය දෑ ස්වභාව ධර්මයෙන් උපුටා ගැනීමට පවතින ආවශ්‍යකත්වයෙන් පැන නගින එය තුලම මුල් බැස පවත්තේ නිදහස, වෙයි. වැඩ දිනය කෙටි කිරීම, එනම් අවශ්‍යකතාව මත නිදහසේ ආධිපත්‍යය අනුක්‍රමිකව තහවුරු වීමේ මූලික මිනුම පිලිබඳව කිව යුත්තේ එයම පමනක් නිදහසේ සාක්ෂාත් වීම නො වන අතර ධනවාදයේ රාමුව තුල එය නිශ්චිතව ම එසේ නො වන බවයි. මෙම ඡේදයේ එන කිසිවක් රොක්මෝර්ගේ මී ලඟ ප්‍රකාශයට ආධාර නො දෙයි: "මාක්ස්වාදය හුදු ප්‍රතිසංස්කරනයන්ට සාම්ප්‍රදායිකව විරුද්ධ වී තිබේ. එහෙත් මෙම ඡේදය තුල දී මාක්ස්, නවීන කාර්මික සමාජයේ හා සැබෑ මානව නිදහසේ සම්පර්කනය, ඇති කල හැක්කේ ධනේශ්වර සමාජය තුල සැබෑ ස්වාමියා වන ආර්ථික ක්‍රියාවලිය මත තම පාලනය යලි තහවුරු කිරීමට මනුෂ්‍ය වර්ගයාට හැකි නම් පමනක් ය'යි අපේක්ෂා කරන බව පෙනේ." එහෙත් (මෙහි ලා අප විසින් පෙන්වා දිය යුතු වන්නේ - පරිවර්තක) ධනවාදය යටතේ ආර්ථික ජීවිතය මත තාර්කාන්විත පාලනය තහවුරු කිරීමක් කල නොහැකිය; එසේම ලාභ සඳහා පවතින තල්ලුව සැබෑ මානුෂික අවශ්‍යතාවන්ට යටත් කිරීම ද ධනවාදය පවත්නාතාක් ඉටු කල නො හැකි ය.

රොක්මෝර් අධිභාෂනය කරන ඓතිහාසික භෞතිකවාදයෙන්, - එංගල්ස් ගෙන් හා මාක්ස්වාදයෙන් තොර වූ මාක්ස් කෙනෙකු අවසානයේ සමාජවාදී විප්ලවයෙන් තොර මාක්ස් කෙනෙක්, බව පැහැදිලිය. හේ සරලව ම සිය ඔළුවෙන් සිට ගෙන සිටින මාක්ස් කෙනෙකු පමනක් නොව මාංචු හා මුකවාඩම් දැමූ " මාක්ස් " කෙනෙකු ද වෙයි.

## සමාප්තිය

මෙම විමර්ශනයට කෙටි සමාප්තියක් ද එක් කිරීම අවශ්‍ය ය. මාක්ස්වාදයෙන් පසු මාක්ස් ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසු ව රොක්මෝර් විසින් සංස්කරනය කරන ලද සැප්තැම්බර් එකොලහේ දාර්ශනික අභියෝගය (බ්ලැක්වෙල් ප්‍රකාශන, 2005) නම් තවත් වෙලුමක් පලවී ඇත. රොක්මෝර් ගේ හා ජෝෂප් මාගෝලිස් ගේ (ටෙම්පල් සරසවියේ දර්ශනවාදය පිලිබඳ මහාචාර්යවරයා) සම කර්තෘත්වයෙන් යුත් මෙම වෙලුමේ හැඳින්වීම තුල අපට පහත සඳහන් දෑ කියවන්නට ලැබේ: "අපගේ සම්ප්‍රදායේ සුපුරුදු භාෂිතයන් හා ප්‍රවර්ග මත සැප්තැම්බර් 11 සිද්ධියට ආමන්ත්‍රනය කිරීමට අප සූදානම් ද යන්න හෝ ඒවා එම කර්තව්‍යයට සෑහේ ද යන්න පිලිබඳ ව යමෙකුට කල්පනාකාරීවනු ඇත. අපට අප ගේ විශ්ලේෂන මෙවලම් කෙරෙහි තවදුරටත් විශ්වාසයක් නැත... දේශපාලන දර්ශනවාදය ලෙස අප දැන සිටි එම දේවල් දැන් යල්පැන ඇතිබව දැන් පෙනී යන අතර අපට උවමනාම මොහොතේ උපකාරීවීමට ඒවාට නො හැකි බව ද පෙනේ.

"මේ අපාරය තවත් ඉල්ලීම් වෙලාගන්නා බවට සැක පහලවේ. සැප්තැම්බර් 11 සිද්ධිය අප ගේ සියලු, සාම්ප්‍රදායික සහතික මත හා විශ්වාසයන් ව්‍යාකූල කර දමා තිබේ. අප ගේ න්‍යායන් මඟින් ලෝකය ග්‍රහනය කරගෙන ඇතැයි යන උපකල්පනය ලෝකය විසින් ම පරාජය කරනු ලැබී ය. කිසිවෙකුට පෙර දැකිය නො හැකි ව තිබූ ආකාරයකට ලෝකය වෙනස් වී ඇත. සුපුරුදු මෙවලම් භාවිතා කිරීමේ කිසිදු සරල ක්‍රමයකින් සැප්තැම්බර් 11 සිද්ධීන් පිලිබඳ නිශ්චයක් කිරීමට අපට නො හැක. ඒවා දෘශ්‍යමාන නියාමය පිලිබඳ අප ගේ අවබෝධයට බාධා කරන අතර, අප ගේ ප්‍රවර්ග නැවතත් තත්වානුකූලව හැඩ ගසාගත හැකි යයි අපට කිව නො හැක."(3)

යථාර්ථය ඉදිරියේ න්‍යායික පක්ෂපාතය හා බුද්ධිමය බංකොලොත්කම පිලිබඳ පාපොච්චාරනයක් ලෙස මීට වඩා නිර්ලජ්ජිත ස්වයං-නිරාවරනයවන සැටි ගැන සිතා ගැනීම පවා යමෙකුට දුෂ්කරය. මහාචාර්ය රොක්මෝර්ට අවශ්‍යව ඇත්තේ කොල්ල කෑ ගුවන් යානා මඟින් ලෝක වෙලෙඳ මධ්‍යස්ථානය පමනක් නො ව වසර 2,500 ක දාර්ශනික චින්තනයේ ගමන් මඟ තුල වර්ධනය කරන ලද ඥානන හා විශ්ලේෂනාත්මක ව්‍යුහයන් ද පුපුරුවා හරිනු ලැබූ බව අපට ඒත්තු ගැන්වීමට ය.

සැප්තැම්බර් 11 සිද්ධීන්ට සුවිශේෂ අනවබෝධනීය (වටහාගත නොහැකි) ස්වභාවයක් ලබා දුන්නේ කුමක් විසින් දැයි රොක්මෝර් අපට නො කියයි. විසිවන සියවස තුල ඊට පෙර සිදු වූ සියල්ලෙන් - ලෝක යුද්ධ දෙකක සන්ත්‍රාසය, හොලෝකෝස්ටය (හිට්ලර් සිදු කල මහා යුදෙව් සංහාරය), ස්ටැලින්වාදී විරේක කිරීම්, පරමානු බෝම්බ දෙකක් හෙළීම හා මේවාට අමතර අනෙකුත් ගිනිය නො හැකි ම්ලේච්ඡ ක්‍රියා මිලියන සිය ගනන් මිනිස් ජීවිත බිලිගති. - 2001 සැප්තැම්බර් 11 සිදුවීම් මෙම කලින් සිදු වූ ශෝඛාන්තයන් ගෙන් වෙන් කරනු ලබන්නේ කුමක් විසින් ද? එම දිනය අනාවරනය කල අලුත් හා මේ දක්වාමත් සිතා ගත නො හැකි ගුනයන් හා ලක්ෂනයන් මොනවා ද?

දැන් පැහැදිලිව පෙනෙන්නට තිබෙන කරුන නම් රොක්මෝර් මාක්ස්වාදයට එල්ල කල ප්‍රහාරය විසින් විසිඑක් වන සියවසේ ප්‍රථම දේශපාලන අභියෝගයට රොක්මෝර් අත්‍යන්තයෙන් ම නුසූදානම් කරන ලද්දේ ය යන්නයි. ඔහු "මාක්ස්වාදයේ" මරනය හා හෙගලියානු විඥ්ඥානවාදය පිලිබඳ මාක්ස්වාදී බන්ධනයේ දාර්ශනික අසම්මතභාවය ප්‍රකාශයට පත්කල රොක්මෝර් අද්‍යතන යථාර්ථය විශ්ලේෂනය කිරීමට හා තේරුම් ගැනීමට සමත් විකල්ප න්‍යායික ව්‍යුහයන් සොයා ගැනීමට පැහැදිලිව ම අසමත්ව සිටී.

## අග සටහන්

1. තත්කාර්යවාදියෙකු ද හේගල්ගේ කටුක සතුරකු ද වූ මහාචාර්ය ජේම්ස් බර්න්හැම්ට දුන් විවාදාත්මක පිලිතුරුවල දී (ශතවර්ෂයක් - යල්පැන ගිය, මානව චින්තනයේ අති දරුනු ව්‍යාකූලකයා යයි බර්න්හැම් හේගල්ට පහර දී තිබුනි.) ට්‍රොට්ස්කි ශ්‍රේෂ්ඨ ජර්මානු චින්තකයාට මෙසේ උපහාර දැක්විය. "හේගල් ලියුවේ ඩාවින්ට හා මාක්ස්ට පෙර ය. ප්‍රන්ස විප්ලවය විසින් චින්තනයට දෙන ලද බලගතු තල්ලුවට ස්තුති වන්නට හේගල් විද්‍යාවේ සාමාන්‍ය ප්‍රගමනය පෙර දුටුවේ ය. සුධීමතකුගේ වුවත් එය පෙරදැකීමක් පමනක් වූ හෙයින්, එයට, හේගල් අතින් ලැබුනේ විඥ්ඥානවාදී ස්වරූපයකි. හේගල් ක්‍රියාත්මක වූයේ තමන් විසින් පරම යථාර්ථය ලෙස ගනු ලැබුනු දෘෂ්ටිමය සෙවනැලි සමග ය. මෙම දෘෂ්ටිමය සෙවනැලි, ද්‍රව්‍යමය ශරීරවල චලනය විනා අනෙකක් පිලිබිඹු නොකල බව මාක්ස් පෙන්වා දුන්නේ ය." (*මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා*, කම්කරු මාවත ප්‍රකාශන, පි. 14-15 ) 1939-1940 ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල පුපුරා ගිය කන්ඩායම්ක අරගලයේ සමාප්තියේ දී බර්න්හැම් සමාජවාදී දේශපාලනය ප්‍රතික්ෂේප කොට අන්ත දකුන කරා වූ තම වේගවත් දේශපපාලන විකාශනය ඇරඹීය.

2. තම *Conspectus on Hegel's Science of Logic* (හේගල්ගේ තර්ක විද්‍යාව පිලිබඳ පොදු සමාලෝචනයක්) නම් කෘතියේ ලෙනින් මේසේ ලිවීයː

"තර්කය වනාහී ඥානනයේ විද්‍යාවයි. එය වනාහී ඥාන විභාගාත්මක න්‍යායයි. දැනුම යනු මිනිසා විසින් යථාර්ථය පිලිබිඹු කිරීමයි. එහෙත් එය වනාහී සරල, අමාධ්‍යගත හා පරිපූර්න වූ පිලිබිඹුවක් නොවේ; එය වනාහී වියුක්ත සංකල්පයන්, නියාම, යනාදියේ නිර්මාන දාමයක සන්තතියකි. මෙම සංකල්ප නියාම යනාදිය (චින්තන විද්‍යාව = 'තාර්කික අධ්‍යාසයය') කොන්දේසි සහිතව, සමීපස්ථව, සදාකාලිකව චලනය වන්නා වූ ස්වභාවයේ සාර්වත්‍රික නියාම පාලිත ස්වභාවය කොන්දේසි සහිතව හා සමීපස්ථව ග්‍රහනය කර ගනී. මෙහි ලා තත්වව, වෛෂයිකව අංග තුනක් පවතී. 1. ස්වභාවය 2. මානව ඥානය = මානව මොලය (මෙම ස්වභාවයේ ම ඉහලම නිර්මානය එයයි.) සහ 3. මානව ඥානය තුල ස්වභාවය පිලිබිඹුවේ රූපාකාරය. මෙම රූපාකාරය හරියට ම සමන්විත වන්නේ සංකල්ප, නියාම, ප්‍රවර්ග යනාදී වශයෙනි. ස්වභාවය සමස්තයක් වශයෙන්, එහි පරිපූර්නත්වයත් එහි අමාධ්‍යගත සමස්තය ලෙස වටහාගැනීම = පිලිබිඹු කිරීම = දර්පනය කිරීම මිනිසාට කල නොහැක්කකි. ඔහුට කල හැක්කේ වියුක්තයන්, සංකල්පයන්, නියාම හෝ ලෝකයේ විද්‍යාත්මක පින්තූරයක් යනාදී වශයෙන් නිර්මානය කර ගනිමින් මෙයට සදාකාලිකව ම සමීප වී ගැනීම පමනි." (ලෙනින් සංගෘහිත කෘති 38 වෙලුම මොස්කව් 1972) 182 පි. මුල්කෘතියේ අවධාරනය)

තවත් ඡේදයක ලෙනින් මෙසේ සඳහන් කලේ යඃ

"ඥානනය යනු චින්තාව විෂය කරා සදාකාලිකව, අනන්තව, සමීපස්ථ වීමයි. මිනිසාගේ චින්තාව තුල ස්වභාවය පිලිබිඹු වීම වටහා ගත යුත්තේ, "අජීවීව නොව" "වියුක්තව නොව", චලනයෙන් තොරව, ප්‍රතිසතිතාවෙන් තොරව නොව, ප්‍රතිසතිතාවන් පැනනගිමින් ද විසඳමින් ද සිදුවන්නා වූ සනාතනික චලනයේ සන්තතිය ඇතුලත්ය."

(එම 195 පිටුව අවධාරනය මුල්කෘතියේ)

© www.wsws.org